Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

**09 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01 ලන්දේසින් විසින් කුරුඳු රැස් කිරීම හා වෙළඳාම සඳහා කපිතාන්වරයෙකු පත් කොට වඩා කාර්යක්ෂම කළේ ................................................................ දෙපාර්තමේන්තුවයි.

02 ඉංග්‍රීසින් ඉන්දියානු සාගරයේ දී ප්‍රංශ ජාතිකයන් සමග ගෙන ගිය නාවික සටන්වල දී .................................... වරාය යුධමය අතින් වැදගත් විය.

03 ශ්‍රී වික්‍රමරාජසිංහ රජු රාජද්‍රෝහී චෝදනා එල්ල කොට ............................................ හිමියන්ට මරණීය දණ්ඩනය පනවන ලදී.

04 බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකා ආර්ථිකය වාණිජ ආර්ථික ක්‍රමයක් බවට පරිවර්තනය කිරීමේ දී ................................................................ යෝජනා උදව් කර ගන්නා ලදී.

05 ඕල්කට්තුමාගේ මැදිහත් වීමෙන් මෙරට බෞද්ධාගමික කටයුතු වැඩි දියුණු කිරීමේ අරමුණින් ........................ ................................................... සමාගම පිහිටුවන ලදී.

(කෝල්බෲක් , කැමරන් , මහබද්දේ , පරණතල, වාරියපොළ සුමංගල, පරම විඥානාර්ථ, ත්‍රිකුණාමලය, ගාලු )

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් වරහන් තුළ (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

06 ඕලන්ද පාලන සමයේ දී ක්‍රිස්තියානි ආගම ප්‍රචාරය සඳහා මිෂනාරි සංවිධාන පිහිටුවන ලදී. (    )

07 1862 දී බෞද්ධයන් සඳහා ලංකෝපකාර නමින් මුද්‍රණාලයක් පිහිටුවන ලදි. (    )

08 හින්දු ආගම සහ සංස්කෘතිය තුල ඇති වැදගත්කම පෙන්වීම සඳහා උදයභානු නම් පුවත්පත ආරම්භ විය. (    )

09 ඉංග්‍රීසින් යටතේ හමුදා සේවයට බැඳුන සිංහලයන් සිපොයි හමුදාව ලෙස හැඳින්වේ. (    )

10 බ්‍රිතාන්‍ය නිෂ්පාදන වර්ජනය කොට ඉන්දියානු නිෂ්පාදන භාවිතය ප්‍රචලිත කිරීම ස්වදේශීය ව්‍යාපාරය මගින් සිදුවිය. (    )

- පහත වගු සටහනේ හිස්තැන් ඇසුරින් 11 - 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| නිදහස් සටන ආරම්භ වූ වර්ෂය | සටනේ නායකයෝ | සටන ආරම්භ වීමට හේතු |
|---|---|---|
| 1818 | 11 ........................................<br>මඩුගල්ලේ දිසාව | 13........................................<br>රදළ ප්‍රධානීන්ගේ බලය අහිමි වීම |
| 12 ........................................ | ගොංගාලේගොඩ බණ්ඩා<br>ඩිංගිරාල | 14 ........................................<br>15 ........................................ |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **පහත සඳහන් ප්‍රශ්න වලට ගැලපෙන නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.**

16 ප්‍රංශ ජාතිකයින් ඉන්දියාවේ බලය ව්‍යාප්ත කර ගත් ප්‍රදේශයක් A අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?




(1) චන්ද්‍රනගර්

(2) ඔරිස්සා

(3) මදුරාසිය

(4) පොන්ඩිචෙරි

17 පින්තූරයෙන් දැක්වෙන්නේ මුගල් අධිරාජ්‍ය සමයේ සුප්‍රකට නිර්මාණයක් වන ටජ් මහල් මන්දිරයයි. මෙය ඉදිකළ රජු පිළිතුරු අතරින් තෝරන්න.



(1) බාබුර් (2) ජහන්ගීර්

(3) ෂා ජහන් (4) මහා අක්බාර්

18 ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් පානදුරාවාදයට මූලිකත්වය දුන් බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් පින්තූරයේ දැක්වේ. එතුමා කවුරුන් ද?




(1) පූජ්‍ය රත්මලානේ ධර්මාලෝක හිමි

(2) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(4) වාරියපොල සුමංගල හිමි

19 පහත සඳහන් නායකයන් අතරින් ඉන්දියාව දෙකඩ කොට පාකිස්ථානය ලෙස මුස්ලිම් රාජ්‍යයක් ගොඩනැගීමට පුරෝගාමී වූ රූපයේ දැක්වෙන පුද්ගලයා මින් කවරෙක් ද?



(1) දඩාබායි නඖරෝජි (2) බාල් ගංගාධාර් තිලක්

(3) මොහොමඩ් අලිජින්නා (4) මහත්මා ගාන්ධි

20 පින්තූරයේ දැක්වෙන්නේ 1910 ක්‍රෑව් මැකලම් ප්‍රතිසංස්කරණයේ දී ප්‍රථම උගත් ශ්‍රී ලාංකික මන්ත්‍රීවරයා ලෙස පත් වූ තැනැත්තාය. ඔහු කවුරුන්ද?



(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා (2) ආරුමුග නාවලර් තුමා

(3) පොන්නම්බලම් රාමනාදන් මහතා (4) එම්. සී. සිද්ධිලෙබ්බේ මහතා


(ල. 20 × 2 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**09 ශ්‍රේණිය** **ඉතිහාසය - II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(A) ඉංග්‍රීසින්ගේ වැඩි අවධානයක් යොමු වූ A අක්ෂරයෙන් දැක්වෙන ස්වභාවික වරාය කුමක්ද?

(B) 1818 සටන ආරම්භ වූ ප්‍රදේශය B අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?

(C) 1602 ජූලි මාසයේ දී ජොරිස් වැන් ස්පිල්බර්ජන් ශ්‍රී ලංකාවට ගොඩබට වරාය කුමන අක්ෂරයෙන් දැක්වේ ද?

(D) පොල් පර්යේෂණ ආයතනය පිහිටා ඇති ලුණුවිල දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 04)

(ආ) (i) පින්තූරයේ දැක්වෙන්නේ හින්දු ආගමික පුනරුදයට උරදුන් නායකයෙකි. ඔහු නම් කරන්න. (ල. 01)




(ii) මෙතුමා පරිත්‍යාගශීලීන්ගේ ආධාරයෙන් ඉදිකළ පාසල කුමක් ද? (ල. 01)

(iii) දෙමළ පාසැල් සිසුන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීම සඳහා යාපනේ ආරම්භ කළ පාසල කුමක් ද? (ල. 01)

(iv) එම පාසල වර්තමානයේ දී හඳුන්වන නම කුමක් ද? (ල. 01)

(ඇ) යාබද සිතියමින් පෙන්නුම් කරන්නේ ඉන්දියාව තුළ යුරෝපා ජාතීන්ගේ බලව්‍යාප්තිය වූ ආකාරයයි. එය ඇසුරු කරගෙන පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) සිතියමේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ ඉන්දියාවේ පිහිටි පෘතුගීසි පාලන මධ්‍යස්ථානයකි. එය කුමක් ද? (ල. 01)

(ii) ලන්දේසි බලය ව්‍යාප්ත වූ ප්‍රදේශයක් වන ඔරිස්සා ප්‍රදේශය දැක්වෙන්නේ මින් කුමන අක්ෂරයෙන් ද? (ල. 01)

(iii) පෘතුගීසින් දායාදයක් ලෙස ඉංග්‍රීසින්ට ලබාදුන් බොම්බාය නගරය දැක්වෙන අක්ෂරය කුමක් ද (ල. 01)

(iv) ප්‍රංශ ජාතිකයෝ වෙළඳ ගබඩාවක් ඉදිකළ ප්‍රදේශයක් D අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද? (ල. 01)



(ඇ) (i) මෙම රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

(ii) මොහු විසින් භාවිතා කරන ලද අවිහිංසාවාදී සටන් උපක්‍රමයක් ලියන්න.

(iii) මෙතුමා නිදහස් සටනක නායකත්වය ගත් රට දක්වන්න.

(iv) බඳු හා වසංගත රෝග වලින් පීඩාවට පත්ව ඇති ජනතාවට සහන ලබා දීමට මෙතුමා ආරම්භ කළ ව්‍යාපාරය කුමක් ද? (ල. 4)

(ල. 16)

02. (i) වර්ෂ 1602 න් පසු උඩරට රජවරුන් හමුවීමට පැමිණි ලන්දේසි දූතයන් තිදෙනෙකුගේ නම් ලියන්න.

(ල. 3)

(ii) උඩරට රාජ්‍යයේ බලයට පත් අවසන් සිංහල රජුගේ නම ලියා ඔහුගෙන් පසුව උඩරට රාජ්‍ය බලය නායක්කර් වංශිකයන් අතට පත්වීමට හේතුව ලියන්න. (ල. 3)

(iii) දිවයිනේ ලන්දේසින් යටතේ පැවති ප්‍රදේශ බෙදා තිබූ ප්‍රධාන කොටස් තුන ලියා ලන්දේසීන් විසින් පවත්වාගෙන ගිය උසාවි පද්ධතියේ ඉහළම උසාවිය වූ මහාධිකරණය හැඳින්වූ නම ලියන්න. (ල. 5)

03. (i) පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජෝන් ඩොයිලි හා සම්බන්ධ ප්‍රකාශ 03 ක් තෝරා ලියන්න.

(i) 1803 උඩරට ආක්‍රමණයට සහභාගි විය.

(ii) යුධ නිලධාරියෙකි.

(iii) රජයේ භාෂා පරිවර්තකයෙකි.

(iv) සිංහල භාෂාව උගත් පුද්ගලයෙක් විය

(v) ෆෙඩ්රික් නෝත් ආණ්ඩුකාරවරයා යටතේ සේවය කරන ලදි.

(vi) උඩරට රදළ ප්‍රධානීන් හා සබඳතා පැවැත් වූවේය. (ල. 3)

(ii) පහත සඳහන් ප්‍රධාන ආර්ථික භෝග බ්‍රිතාන්‍යයන් විසින් පළමු වරට ආරම්භ කළ ස්ථානය හා සම්බන්ධව හිස්තැන් පුරවන්න.

| ආර්ථික භෝගය | පළමු වරට ආරම්භ කළ ස්ථානය |
|---|---|
| 1. කෝපි | 1. ........................................................... |
| 2. ............................... | 2. ලූල් කඳුර වතු යාය |
| 3. රබර් | 3. ........................................................... |

(ල. 03)

(iii) බ්‍රිතාන්‍යයන් විසින් තේ වගාව ආරම්භ කළ පසු එය මෙරට ප්‍රමුඛ අපනයන භෝගය බවට පත් වීමට බලපෑ හේතු 02 ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04. (i) 1833 වර්ෂයේ බ්‍රිතාන්‍යයන් විසින් ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද? (ල. 2)

(ii) මෙම කාලය තුල දේශීය කෘෂිකර්මාන්තය පරිහානියට පත්වීමට බලපෑ ප්‍රධාන හේතු 03 ක් ලියන්න. (ල. 3)

(iii) 1848 නිදහස් සටනට පසු දේශීය වැව් අමුණු ප්‍රතිසංස්කරණය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු තුන් දෙනෙක් ලියන්න. (ල. 3)

(iv) ගොවි ජනතාවගේ යහපත වෙනුවෙන් ගොඩනගන ලද සමුපකාර සමිති ව්‍යාපාරයේ අරමුණු තුනක් ලියන්න. (ල. 3)

05. (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරී සමාගම් තුනක නම් ලියන්න. (ල. 3)

(ii) පහතින් දක්වෙන්නේ බෞද්ධ පුනරුද ව්‍යාපාරය යටතේ නායකත්වය ගත් භික්ෂූන් වහන්සේලා හා උන්වහන්සේලා මූලිකව පිහිටවූ පිරිවෙන් වේ. ඒ ආශ්‍රිතව හිස්තැන් පුරවන්න.

| භික්ෂූන් වහන්සේ ගේ නම | පිහිටවූ පිරිවෙන |
|---|---|
| පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි | 2. ................................................................ |
| 1. ................................................................ | මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන |
| රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි | 3. ................................................................ |

(ල. 3)

(iii) බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාර සමයේ හෙන්රි ස්ටීල් ඕල්කට් තුමාගේ මගපෙන්වීම මත මෙරට පිහිට වූ සමාගම ලියා එම සමාගමේ මැදිහත්වීමෙන් පිහිටවූ බෞද්ධ පාසල් 03 ක නම් ලියන්න. (ල. 5)

06. (i) ඉංග්‍රීසින්ට විරුද්ධව ඉන්දියානු භටයන් ඇති කළ සිපොයි කැරැල්ලට බලපෑ හේතු 03 ක් ලියන්න.(ල. 3)

(ii) ඉන්දියානු නිදහස් සටනේ සිටි ශ්‍රේෂ්ඨතම නායකයා වූ මහත්මා ගාන්ධි තුමා විසින් ක්‍රියාත්මක කරන ලද අවිහිංසාවාදී සටන් උපක්‍රම 03 ක් ලියන්න. (ල. 3)

(iii) ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනෙන නායකයන් දෙදෙනෙකුගේ නම් ලියා ඉන් එක් අයෙකු පිළිබඳ විස්තර කරන්න. (ල. 5)

07. (i) "සම්භාවනීය මහල්ලා" යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ ඉන්දීය නිදහස් සටනේ නායකයා කවුරුන්ද? (ල. 1)

(ii) පහත සඳහන් වන්නේ ඉන්දියාවේ ආගම් කීපයක් තම ආගම් පුනර්ජීවනය ඇති කිරීමට පිහිටුවාගත් සංවිධාන කීපයකි. එම ආගමික සංවිධාන බිහි වූයේ කුමන ජන කණ්ඩායම් අතර දැයි ඉදිරියෙන් ලියන්න. (ල. 2)

A - බ්‍රහ්ම සමාජය - B - සිං සභා -

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(iii) පහත සඳහන් උපකාරක පද උදව් කර ගෙන ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

1. ටජ්මහල තැනවූයේ මෙම රජපෙළපතෙහි පාලකයෙකි

3. ඉන්දියාවට පැමිණි පෘතුගීසි දේශ ගවේෂකයෙකි

4. රාම් මෝහන් පඬිතුමා හින්දු ආගමික, සංස්කෘතික පිබිදීම සඳහා මෙම සමාජ සංවිධානය පිහිටුවීය.

8. ඉංග්‍රීසින් තම බලය ඉන්දියාව තුළ පැතිරවීමට මෙම ගිවිසුම් ක්‍රමය භාවිත කරන ලදී.


<u>පහළට</u>

2. පෘතුගීසින් පෙරදිග පෘතුගීසි මධ්‍යස්ථානය පිහිටවූයේ ඉන්දියාවේ මෙම ප්‍රදේශය යටත් කරගෙනයි.

5. ඉන්දියානු නිදහස් සටනේ ශ්‍රේෂ්ඨතම නායකයාය.

6. රජයේ ලුණු සම්බන්ධ නීති කඩ කරමින් විරෝධය පෑ පා ගමන

7. බිහාර් ප්‍රාන්තයේ ඉන්ඩියෝ වගා කළ ජනතාවගේ දුක් ගැනවිලි විසඳීමට ගාන්ධිතුමා ගෙනගිය ව්‍යාපාරය (ල. 08)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

01. මහබද්දේ 02. ත්‍රිකුණාමලය 03. පරණාතල 04. කෝල්බෲක් 05. පරම විඥානාර්ථ 06. (✗)
07. (✓) 08. (✓) 09. (✗) 10. (✓) 11. කැප්පෙටිපොල ගලගම ආදීන් 12. 1848
13. රජෙකු නැතිවීමේ කනස්සල්ල ආදිය 14. කෝල්බෲක් ප්‍රතිසංස්කරණය 15. දේශීය කෘෂිකර්මාන්තය අඩපණ වීම. 16. (iv) 17. (iii) 18. (ii) 19. (iii) 20. (iii)

(2 x 20 = ල. 40)

## II කොටස




01. අ. 1.ආරුමුග නාවලර් තුමා
2. ශෛව ප්‍රකාශ් විද්‍යාලය
3. යාපනයේ ශිවන්ගල විද්‍යාලය
4. යාපනයේ හින්දු විද්‍යාලය

ආ. 1. ගෝව
2. B
3. C
4. සුරාට්

ඇ. 1. මහත්මා ගාන්ධි
2. සත්‍යග්‍රහ, සිවිල් නීති කඩ කිරීම, පාගමන් සංවිධානය ආදිය
3. ඉන්දියාවේ
4. බේඩා ව්‍යාපාරය

02. (i) i. ජොරිස් වැන් ස්පිල්බර්ජන්
ii. ජෙනරල් ජෙරාඩ් හල්ෆ්ට්
iii. කලන් අල්බස්
iv. කොරනේලියස් ටැකල්

ii. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ
ඔහු විසින් නායක්කර් වංශික බිසවක් විවාහ කරගන්නා ලද අතර ඔවුනට දරුවන් නොමැති වීමෙන් දකුණු ඉන්දීය නායක්කර් වංශික සිරිතට අනුව ඉන්පසු රාජ්‍ය උරුමය බිසවගේ සහෝදරයෙකුට උරුම වීම.

iii. i. ගාලු කොමාන්ඩරිය / කොළඹ කොමාන්ඩරිය / යාපනය කොමන්ඩරිය
ii. රාද් වැන් ජස්ටිට්

03. i. රජයේ භාෂා පරිවර්තකයෙකි , සිංහල භාෂාව උගත් පුද්ගලයෙකු විය. / උඩරට රදළ ප්‍රධානීන් හා සබඳතා පැවැත්විය.
ii. 1. ගම්පොල සිංහ පිටිය 2. තේ 3. පේරාදෙණිය හා හෙනරත්ගොඩ උද්‍යාන
iii. තේ වගාවට උචිත පරිසරය / ලෝක වෙළඳපොලේ ඉහළ ඉල්ලුම / මාර්ග පහසුකම් දියුණු වීම / ලාභදායී ශ්‍රමය මින් 02 ක් විස්තර කිරීම

04. i. කෝල්බෲක් ප්‍රතිසංස්කරණය
ii. අවශ්‍ය වැව් අමුණු නඩත්තු නොකිරීම / සම්ප්‍රදායික ඉඩම් වතු වගාවට යොදා ගැනීම / වනාන්තර එළි පෙහෙලි කිරීමෙන් ජල උල්පත් සිඳීයාම ආදිය
iii. හෙන්රි වෝඩ් / හර්කියුලිස් රොබින්සන් / විලියම් ග්‍රෙගරි / ආතර් ගෝඩින්
iv. ගොවි ජනයාට අඩු පොලියට ණය ලබාදීම / ණයබර අඩු කොට ආර්ථිකය ශක්තිමත් කිරීම / සුභ සාධනය ඉහළ නැංවීම / ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම

05. i. ලන්ඩන්, බැප්ටිස්ට්, වෙස්ලියන්, ඇමරිකන්, චර්ච් මිෂනාරි සමාගම
ii. 1. හික්කඩුවේ සුමංගල හිමි 2. රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන 3. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන
iii. i. පරම විඥානාර්ථ සමාගම
ii. කොළඹ ආනන්ද විද්‍යාලය / මහනුවර ධර්මරාජ විද්‍යාලය / ගාල්ල මහින්ද විද්‍යාලය / නාවලපිටිය අනුරුද්ධ විද්‍යාලය / කොළඹ මියුසියස් විද්‍යාලය ආදිය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

06. i. i. සිපොයි හටයන් තුල ඉංග්‍රීසින් කෙරෙහි පැවති කළ කිරීම
ක්‍රිස්තියානි ආගම පැතිරවීමට ඉංග්‍රීසි සහය ලැබීම
වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්ති නිසා දේශීය කර්මාන්ත අභාවයට යාම ආදිය

ii. සත්‍යග්‍රහ, රජයට සහය නොදැක්වීම
සිවිල් නීති කඩ කිරීම, උපවාස , පා ගමන්

iii. දඩාබායි නඖරෝජි
ජවහල්ලාල් නේරු
බාල් ගංගාධාර්
සුරේන්ද්‍රනාත් බැනර්ජි
මහත්මා ගාන්ධි ආදී දෙදෙනෙක් නම්කොට එක් අයෙකු පිළිබඳ විස්තරකොට තිබීම.

07. i. දඩාබායි නඖරෝජි

ii. A හින්දු ජනතාව
B සික් ජනතාව

iii.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 මු | ග | ල් | | 4 බ්‍ර | හ් | 5 ම |
| | | | | | | හ |
| | 2 ගෝ | | | | | ත් |
| | 3 ව | ස් | කෝ | 6 ද | ගා | මා |
| | | | | ණ් | | ගා |
| | | 7 ච | | ඩි | | න් |
| | | ම් | | | | ධි |
| | 8 උ | ප | කා | ර | ක | |
| | | ර | | | | |
| | | න් | | | | |